පුරාවිද්‍යාත්මක දත්ත මගින් හෙළිවන කූරගල මානව ජනාවාස තොරතුරු

එච්. එම්. සමන් කුමාර ඇරැගම

Archaeological Evidence from the Kuragala Site, Sri Lanka

H. M. Saman Kumara Eregama

Department of Archaeology, Government of Sri Lanka, Colombo, Sri Lanka.
eregama@gmail.com

Abstract

The Kuragala archaeological site is located in the Balangoda division of the Ratnapura district, southwestern Sri Lanka. This paper summarises archaeological investigations carried out in and around Kuragala indicating that human habitation in the region extended beyond 15,000 years into the past. Chronometric dating of the site and archaeological evidence show that Late Pleistocene and Early Holocene modern humans who followed a hunting and gathering subsistence pattern lived in this region. Archaeological finds and data from the Kuragala excavation include microlithic tools, bone tools, processed animal bones and beads, which indicate behavioural modernity among the inhabitants. This paper also discusses aspects of early historic occupation of the site based on the existence of human-modified drip-ledge caves and stone inscriptions.

ANCIENT LANKA

Volume 1 (2022): Siran Deraniyagala Commemoration Volume

© 2022 by the author/s. https://doi.org/10.29173/anlk647
This is an open access article distributed under the terms and conditions of the Creative Commons Attribution CC BY 4.0

කුරගල මානව ජනාවාස තොරතුරු - සාරාංශය

කුරගල පුරාවිද්‍යා අඩවිය, ශ්‍රී ලංකාවේ නිරිතදිග, රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් ය. කුරගල හා ඒ අවට ජීවත් වූ මානවයින් පිළිබඳව සිදුකරන ලද විද්‍යාත්මක කාලනිර්ණයන්ගෙන් හා පුරාවිද්‍යාත්මක කරුණු මගින් පැහැදිලි වන්නේ එහි මානව ජනාවාස ව්‍යාප්තිය අදින් වසර 15,000 කට පෙර දක්වා විහිද තිබූ බව ය. මෙම ලෙන් හා එළිමහන් ජනාවාස කේන්ද්‍ර කරගනිමින් වාසය කළ පිරිස් ඉහළ ප්ලයිස්ටෝසීන සහ හොලොසීන යුගවල දඩයම හා වන ද්‍රව්‍ය එක්රැස් කරමින් සරල යැපුම් රටාවක් අනුව ශ්‍රී ලංකාවේ ජීවත් වූ නවීන මානවයින් බව පැහැදිලි ය. දුරස්ථ භුවමාරුව, අවකාශය බෙදා හදා ගැනීම, සංචරණය, ආභරණ හා පබළු භාවිතය, අභිචාර විධි පරිහරණය, නවීන මයික්‍රොලිතික ශිලා මෙවලම්, අස්ථි මෙවලම් භාවිතය හා හැසිරීම් රටාවන් වැනි ලක්ෂණ හරහා මෙම නවීන මානව චර්යා තහවුරු කරගත හැකි ය. ශිලා ලේඛන හා පවතින භෞතිකමය කටාරම් සහිත ලෙන් තොරතුරු පාධක කරගෙන කුරගල ප්‍රදේශය ආශ්‍රිතව වූ ලිඛිත මුල් ඓතිහාසිකත්වය විමර්ෂණය කිරීමක් ද මෙහිදී සිදුකර තිබේ.

ප්‍රමුඛ පද *- ප්‍රාග්ඓතිහාසික, බලංගොඩ, කුරගල, මයික්‍රොලිතික, ජනාවාස,*

කුරගල පරිසරය

කුරගල පුරාවිද්‍යා ස්ථානය රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ **258/F** කුරගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් ය. කුරගල පුරාවිද්‍යා භූමියේ නිරපේක්ෂ පිහිටීම අනුව, උතුරු අක්ෂාංශ 6" 37º 6" 38º ත් නැගෙනහිර දේශාංශ 80" 52º 80" 53ºත් අතර පිහිටා තිබේ. භූ විෂමතාවයෙන් උස්බිම් සංකීර්ණයත් වන්නි සංකීර්ණයත් අතර මීටර් 300 - 750 ත් අතර විහිද යන බාදන තලයට කුරගල භූ කලාපය අයත් වේ (නවරත්න 2003: 163; Deraniyagala 2003: 2). මුහුදු මට්ටමේ සිට අඩි 1500 ක් පමණ උසින් කුරගල පිහිටා ඇත. කුරගල පහතරට වියළි කලාපයටත්, තෙත් කලාපයටත් අතර පිහිටි අන්තර් කලාපයට අයත් ය. කුරගල සහ හිටුවන්ගල යන පර්වත වේදිකා 'නයිස්' (Gneiss) යන තද කළු ගල් පාෂාණයෙන් නිර්මාණය වී ඇත (Cooray 1967: 67).

1 රූපය කුරගල ප්‍රාග්මානව ජනාවාසයේ පිහිටීම සහ කුරගල ලෙන් සංකීර්ණය අයත් පාෂාණ උද්ගතය.





2 රූපය කුරගල ආසන්නතම භූ පිහිටීම සහ *කුරගල ප්‍රාග් ඓතිහාසික ලෙන.*





මෙම ප්‍රදේශයට අයත් ප්‍රධානතම ඛනිජ වර්ග වන්නේ තිරිවානා වර්ග, ෆෙල්ඩ්ස්පාර්, ක්වාට්සයිට්, ඩොලමයිට්, හා මැණික් ය. පස මූලික වශයෙන් උස්බිම් කලාපයට අයත් පාෂාණ අධික වර්ෂාපතනය හේතුකොටගෙන ඇති වූ රතුවන් කහ පොඩ්සෝල් පාංශු පංතියට අයත් ය (Cooray 1967). කුරගල කඳුරට වියළි කලාපීය වෘක්ෂලතා කලාපයට අයත් වුව ද, තෙත් හා වියළි සංක්‍රාන්තික කලාපයේ අවසාන සීමාවේ පිහිටා ඇත. වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 30-35 ත් අතර වේ. වාර්ෂික වර්ෂාපතනය මි. මී. 1500-2000 ත් අතර වර්ෂාපතනයක් ලැබේ (කාරියවසම් 2003: 174-176). ප්‍රධානතම ගංගාව වන වළවේ ගඟ මධ්‍ය කඳුකරයේ දකුණු අන්තයෙන් හා සබරගමු කඳුවැටියේ නැගෙනහිර දෙසින් ආරම්භ වී පෝෂණය වී වර්ෂය පුරාම නොසිඳී පවතී (බ්‍රෝහියර් 1950: 19). කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයාගේ බොහෝ ක්‍රියාකාරකම් සඳහා ගංගා ආශ්‍රිත ජලවහන රටාව ද විශේෂයෙන් බලපාන්නට ඇත.

ඓතිහාසික පසුබිම

ක්‍රිස්තු පූර්ව 2-1 කාලයේ දී බෞද්ධාගමික ලෙන් ආරාම සංකීර්ණයකි (බිනරගම 2013: 203-219). කුරගල හා තදාසන්න කලාපයේ කටාරම් කෙටූ පූර්ව බ්‍රාහ්මී ලිපිවලින් සමන්විත ලෙන් ආරාම සාධක හමු වේ. කුරගලට ආසන්නව ගල් වැම්යාය, බුදුගල, ඇඳගල, දියවින්න ආදී ක්‍රිස්තු පූර්ව 2 සිට ක්‍රිස්තු වර්ෂ 10 සියවස්වලට අයත් වන ආගමික හා පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු ස්ථාන රාශියක් පිහිටා ඇත (ඇරෑගම 2015: 6-8; ඇරෑගම 2017). කුරගල ආරණ්‍ය තපෝවනයේ ක්‍රි. පූ. 2- 1 සියවස්වලට අයත් එවැනි කෙටි ලෙන් ලිපි තුනක් තිබූ බව පුරාවිද්‍යාත්මක තොරතුරු සනාථ කරයි. එම ලිපි සී. එච්. කොලින්ග්ස් විසින් වාර්තා කර තිබේ (Collings 1932). 1970 දී මහාචාර්ය සෙනරත් පරණවිතාන එම ලිපි සඳහා අර්ථ සපයා ඇත. Inscription of Ceylon vol 1 සෙල්ලිපි අංක 774, 775, හා 776 යන පිටපත් මගින් ලිපි ප්‍රකාශයට පත්කර ඇත.

1. දතහ සමුදහ ලෙනෙ - Inscription of Ceylon vol 1- 774,
   දත්ත හා සමුද්දගේ ලෙන
2. I පරුමක සුමනහ,
   II පරුමකලු සුමයා - Inscription of Ceylon vol 1- 775,
   ප්‍රධාන සුමන හා
   ප්‍රධාන සුමයා ගේ ලෙන
3. I. පරුමක සෝණි පුතස
   II. බත පුතස ගුතස ලෙනෙ - Inscription of Ceylon vol 1- 776,
   ප්‍රභු ගුතස ගේ පුත් ප්‍රධාන සෝණ ගේ පුතාගේ ලෙන (Paranavithana1970)

ලිපිවල සරල අර්ථයන් වී ඇත්තේ ලෙන් සකසා සතර දෙසින් වඩිනා සංඝයා වෙත පූජාකර ඇති බවකි.

කුරගල 1971 අගෝස්තු මස 11 වන දින ගැසට් පත්‍රය මගින් පුරාවිද්‍යා රක්ෂිතයක් බවට නම් කර තිබේ. කුරගල පුරාවිද්‍යා රක්ෂිත භූමිය ආශ්‍රිතව 2006, 2013, 2015 යන වර්ෂයන්හි පුරාවිද්‍යා ගවේෂණයට ලක්කර ඇත (විජේරත්න සහ තවත් අය 2006; සන්දනායක සහ තවත් අය 2015: 57-64; Somadeva et al., 2015).

3 රූපය කුරගල සෙල්ලිපි

කුරගල ප්‍රාග්ඓතිහාසික පුරාවිද්‍යා කැණීම

2013 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කුරගල ප්‍රධාන ලෙන් සංකීර්ණය කේන්ද්‍ර කරගනිමින් කැණීම් ව්‍යාපෘතික් සිදුකර ඇත. ජී. පී. එස්. කණ්ඩාංක 06º 37" 36' N හා 080º 52" 09' E යටතේ ප්‍රධාන ලෙන ආශ්‍රිතව කැණීම් ආරම්භ කිරීමට පෙර ලෙන් පරිශ්‍රයට ඉදිරියෙන් පර්යේෂණ කැණීම් වළක් යොදා ඇත. එමගින් මූලික ප්‍රාග් ඓතිහාසික සාධක අනාවරණය කරගෙන තිබේ. ඒ අනුව එම ස්ථානය ට ආසන්නව ලෙන් පියස්ස පාමුල කොටු දැල් ක්‍රමය භාවිතකර ස්තරානුකූලව කැණීම් කර තිබේ (ඇරැගම සහ සිරිසේන 2013; Eregama and Perera 2016).

4 රූපය කුරගල ප්‍රාග්ඓතිහාසික පුරාවිද්‍යා කැණීම



5 රූපය කුරගල කැණීම් පරිශ්‍රය

මූලික පර්යේෂණ කැණීම් පරිශ්‍රය ලෙන ඉදිරිපස.

මූලික පර්යේෂණ කැණීම් වලෙහි පංශු සංදර්භ.

ප්‍රධාන කැණීම් පරිශ්‍රයේ කැණීමට පෙර තත්ත්වය.

ප්‍රධාන ලෙන ආශ්‍රිත කැණීම් ආරම්භය.

කුරගල පස් ස්තර නිර්මාණය වීමේ ස්වභාවය

පුරාවිද්‍යාත්මක ජනාවාස අවධියක් වෙන්කර ගැනීමට භාවිත කළ හැකි ප්‍රායෝගික නිර්ණායකයන් ලෙසින් කාලනිර්ණය, ස්තර වින්‍යාසය, පුරාවස්තු ව්‍යාප්තිය, පුරාවස්තු ඝනත්වය, මානව ක්‍රියාකාරකම්හි වෙනස්කම්, පරිසර සාධක හා වෙනත් භෞතිකමය නිර්ණායකයන් ස්තරායනය සඳහා යොදාගෙන තිබේ. කුරගල පුරාවිද්‍යා කැණීමෙන් ලබාගන්නා ලද සියලු දින වකවානු නිරපේක්ෂ කලනිර්ණයන් ය. ඇමරිකාවේ බීටා ඇනලිටික් ආයතනයේ 14 C කාලනිර්ණ ක්‍රමෝපායන් මේ සඳහා භාවිතයට ගෙන තිබේ (ඇරැගම 2013:11-12; Eregama and Perera 2016).

අදින් වසර මිලියන දහස් ගණනකට ඉහත දී කුරගල ලෙන් කුහරය නිර්මාණය වීමට පටන් ගන්නට ඇතැයි භූ විද්‍යාඥයෝ විශ්වාස කරති. කුරගල සම්බන්ධයෙන් සිදුකර ඇති පුරාවිද්‍යාත්මක පර්යේෂණයට අනුව අදින් වසර 15,163 වැනි කාලයක දී ගල්ලෙනෙ හි පළමු ජනාවාස අවධිය ආරම්භ වී තිබේ. එයින් පැහැදිලි වන්නේ වසර 20,000 කට ආසන්න කාල වකවානුවක සිට මෙම ලෙන් අවකාශය මානව ජනාවාසයට සුදුසු මට්ටමට සකස් වී තිබූ බවකි. කුරගල කැණීමෙන් අනාවරණය කරගන්නා ලද සමස්ත පස් ස්තර ඒ ඒ ස්තරයන් ට ආවේණික ලක්ෂණ සමගින් අවධි 9 ක් ලෙසින් ඛණ්ඩනය කර දින වකවානු අනුව පෙළගස්වා ඇත.

මෙම ලෙනෙහි හමුවන මුල්ම ස්වභාවික තැම්පතු සීමාව මව් පාෂාණය ලෙසින් අර්ථ දක්වයි (ඇරැගම 2015: 13; Perera 2013; Eregama & Perera 2016). මෙම මව් පාෂාණය මත ගල් රන්දෙන් කඩා වැටුණු ගල් කුට්ටි තැම්පත්ව ඇත' මෙහි දෙවන අවධිය ප්‍රාග්ඓතිහාසික මානව ක්‍රියාකාරකම් සිදුවන්නට ඇතැයි අනුමාන කරනු ලබන අවධියයි. අවසන් ග්ලැසියර් සීමාවේ ක්‍රියාකාරකම් විය හැකි ය. මෙහි කිසිදු සංස්කෘතික ද්‍රව්‍යමය සාධකයක් හමු නොවේ. පළමුවෙන්ම හමුවෙන මානව ජනාවාස තෙවන අවධිය නියෝජනය කරයි. අවසන් ප්ලයිස්ටෝසීන සමයේ සාධක සහිත පළමු කාලනිර්ණ මානව ජනාවාස තට්ටුව ලෙසින් ද මෙය හඳුනාගත හැකි ය. කුරගලින් අනාවරණය වන මීළඟ මානව ජනාවාස ක්‍රියාකාරකම් අවධිය 10 ka (10,000) ලෙසින් රේඩියෝ කාබන් කාලනිර්ණයන් ලැබී ඇත. අවසන් ග්ලැසියර් සීමාව හා මුල් හොලෝසීන සීමාවේ කුරගල ලෙන් වාසීන්ගේ වාසස්ථාන සිදුවීම් මෙහි අන්තර්ගත ය (Eregama & Perera 2016, ඇරැගම 2017).

වගුව 1. කුරගල නිරපේක්ෂ කලනිර්ණය

නියැදිය	ස්තරය	Measured	Conventional	Calibrated (cal. years BP) (OxCal 4.1,
BK/2013/N2W1/CX/6	6	5300 ± 40	5300 ± 40	6171-5926
BK/2013/N2W1/CX/8	8	6200 ± 40	6170 ± 40	7189-6940
BK/2013/N2W1/CX/15	15	9300 ± 40	9230 ± 40	10572-10296
BK/2013/N2W1/CX/17	17	2790 ± 30	2750 ± 30	2940-2766
BK/2013/N2W1/CX/37	37	10400 ± 40	10380 ± 40	12404-12034
BK/2013/N2W1/CX/35	35	12590 ± 60	12580 ± 60	15163-14536

මෙම ලෙනෙහි වැදගත්ම අවධිය ලෙසින් සැලකිය හැක්කේ පස්වන අවධියයි. මෙම අවධියේ රේඩියෝ කාබන් දිනවකවානු සංදර්භ අංක 08 මගින් ලැබී තිබේ. අදින් වසර 7170-6950 ලෙසින් මෙහි දින වකවානු ගණනය කිරීමට ලක්ව තිබේ. කුරගල ලෙන් කුහරයේ මධ්‍ය හොලෝසීන ජනාවාසකරණ පස් තැම්පතු නියෝජනයක් පෙන්නුම් කරන්නේ හයවන අවධියෙනි. මෙහි පස් තැම්පතු රේඩියෝ කාබන් කාලනිර්ණ වෙත යොමු කිරීමෙන් ගණනය කිරීම් අදින් වසර 5970-5940 BP ලැබී තිබේ. මෙම අවධියේ සීමිත සත්ත්ව අවශේෂ ප්‍රමාණයක් හා සීමිත ශිලා මෙවලම් සනත්වයක් දැකගත හැකිය (Eregama & Perera 2016; ඇරැගම 2017).

හත්වන අවධිය ලෙන් කුහරයේ මුල් හොලෝසීන මූල ඓතිහාසික තත්ත්වයේ ජනාවාසකරණ පස් තැම්පතු නියෝජනයක් පෙන්නුම් කරනු ලබයි. පස් තැම්පතු රේඩියෝ කාබන් කාලනිර්ණ වෙත යොමුකිරීමෙන් ගණනය කිරීම් දින වකවානු අදින් වසර 2890-2780 BP ලැබී තිබේ (Eregama & Perera 2016; ඇරැගම 2017). මෙය යම් විටක ශ්‍රී ලංකාවේ ගල් යුගයේ ඉහළ සීමාවේ නියෝජන අවධියක් විය හැකි බවට අනුමාන කළ හැකි ය.

මෙම ලෙනෙහි රේඩියෝ කාබන් දින වකවානු ලබා නොගත් අවධිය අටවන අවධියයි. අටවන අවධිය හා නවවන අවධිය හොලෝසීනයේ අවසන් භාගයේ නියෝජනයන් පෙන්නුම් කරයි. ඒ අනුව පූර්ව ඓතිහාසික යුගයේ දී හා මූල ඓතිහාසික යුගයේ දී මෙහි පැවති පස් තැම්පතු කැළඹීමට ලක් වී ඇත. විශේෂයෙන්ම බෞද්ධ විහාර ආරාම ඉදි වූ අවධියේ දී වූ සාධක මෙම අවධියෙන් හෝඩුවාවක් ලෙසින් ලබා ගැනීමට හැකි ය. විහාර ආරාම ඉදිවූවායින් පසුව කුරගල පුරාවිද්‍යාත්මක ස්ථානය ආශ්‍රිතව පල්ලියක් ද ඉදිකර තිබේ. මෙම පසු කාලීන

ඓතිහාසික, හා ඉතා මෑත කාලීන (~ 100 සිට වත්මන) ආගම්වල ඉදිකිරීම් කටයුතු නිසා ප්‍රාග්ඓතිහාසික මානව ජනාවාස අවධීන්ගේ තොරතුරු විතැන් වන්නට ඇත.

වර්ග මීටර් 6 ක් වැනි කුඩා වපසරියකින් සංදර්භ 49 කින් යුතු තැම්පතු අතරින් කුරගල ප්‍රාග් ඓතිහාසික තොරතුරු සඳහා වැඩි සනත්වයකින් යුතු පුරා කෘති රැසක් අනාවරණය කර ගැනීමට හැකි වී තිබේ. තෙත් කලාපීය පරිසර තත්ත්වයන් තුළින් මෙන් තරමක් නිරවුල් පස් තැම්පතු මෙම ලෙනෙන් මතුව නැති අතර, බොහෝ සංකීර්ණ හා පැහැදිලි ලෙසින් වෙන්කර ගැනීමට අසීරු තත්ත්වයන් යටතේ ඉහත වෙන්කර ගැනීම් සිදුව තිබේ.

6 රූපය කුරගල කැණීම

සංදර්භ විහිදීම කොටු දැලට අනුව.

අංක 7 සංදර්භය.

මීටර් 2 x මීටර් 3 ප්‍රමාණ කැණීම් වල

කුරගල ප්‍රාග් ජනාවාසයේ ද්‍රව්‍යමය සංස්කෘතිය හා ආහාර රටාවන් පිළිබඳ සාධක

නවීන විද්‍යාත්මක මතය අනුව වත්මනෙහි ජීවත්වන මානවයන්ගේ පූර්වජයින් වූ නවීන මානවයින් යන නවතම සංකල්පයෙන් හඳුනාගනු ලබන මානවයින්ගේ ද්‍රව්‍ය සංස්කෘතිය වත්මන් මිනිසුන්ගේ ද්‍රව්‍ය සංස්කෘතිය තරම් ම සංකීර්ණ නොවූ බවක් පෙන්වයි (පෙරේරා 2010: 11-13). ඔවුන්ගේ ද්‍රව්‍ය සංස්කෘතියෙන් අපට භෞතිකව ඉතිරිව ඇත්තේ නොදිරන සුලු ද්‍රව්‍ය පමණක් වීම ය. භාවිතයට ගන්නා ලද බොහෝ කාබනික සාධක ප්‍රමාණයක් පවත්නා පරිසර ක්‍රියාකාරීත්වයෙන් විනාශයට පත්ව තිබේ. කුරගල ප්‍රාග්ඓතිහාසික මානව ජනාවාසය කේන්ද්‍ර කරගනිමින් ජීවත් වූ ප්‍රාග්තිහාසික මානවයන් විසින් භාවිතයට ගන්නා ලද පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත නියැදි රැසක් හෙළි කරගෙන තිබේ.

ලොවපුරා සෑම සත්ත්වයකුට අදාළ යැපීම් රටාවන් තුනක් පවතී. එනම්, මාංශභක්ෂක (carnivorous), ශාකභක්ෂක (herbivorous*)*, සර්වභක්ෂක (omnivorous) ලෙසින් කොටස්කර එය හඳුනා ගනී. කුරගල විසූ ප්‍රාග්ඓතිහාසික මානවයා සර්ම කලාපීය වර්ෂා වනාන්තරවල හා වියළි කලාපයේ මෙන්ම අතරමැදි කලාපයේ ශාක සම්පත් ඉතා සුලභව පරිභෝජනය කිරීම ඒ අතර දැකගත හැකි වූ ප්‍රබලතම සාධකයයි (Roberts et al., 2015: 1246-49). කුරගල ජීවත් වූ මානවයින් තමන් ජීවත් වූ පරිසර කලාපය තුළින්ම ස්වාධීනව තම යැපීම් ක්‍රමවේදය සකසාගත් බව පැහැදිලි ය. එය ඔවුනටම ආවේණිකව හුරුකරගන්නා ලද යැපීම් අර්ථ ක්‍රමයකි. නොඑසේනම් ස්වාධීන පරිභෝජන රටාවකි. කුරගල විසූ ප්‍රාග්ඓතිහාසික මානවයින් තමා ජීවත් වූ පරිසරයට අනුගත වෙමින් සරල එහෙත් සියල්ල සම්පූර්ණ වන්නා වූ දිවි පෙවතක් ගෙවූ බව අනුමාන කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ මයික්‍රොලිතික යුගයේ දී මානව ජනාවාස රටාව වඩාත් පුළුල් හා සංකීර්ණ තලයක ව්‍යාප්තව තිබූ බවට මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ මගින් පැහැදිලි ය (Perera 2010: 2). අදින් වසර 48,000 කට පමණ පෙර සිට එම වැසියන්ගේ මාංශමය ආහාර ජාලයේ පුළුල් බව විවිධ කාල වකවානුවල දී සිදුකරන ලද කැණීම්, පර්යේෂණ, විශ්ලේෂණ මගින් පැහැදිලි කරගෙන තිබේ (Perera 2015: 104-117). ප්ලයිස්ටෝසීන අවසන් සමයේ දී ජනාවාසකරණයට ලක්වන කුරගල පුරාවිද්‍යා ස්ථානයේ විසූ ප්‍රාග්ඓතිහාසික මානවයින්ගේ මාංශමය ආහාර සංචිතයේ වැඩි වශයෙන් දැකගත හැකි වන්නේ අපෘෂ්ඨ වංශිකයින් වන මොලස්කාවන් ය. කෙසේ වෙතත් පෘෂ්ඨවංශිකයින් වන කුඩා ප්‍රමාණයේ ක්ෂීරපායින්ගේ සිට විශාල ප්‍රමාණයේ අලියා දක්වාම වූ සත්ත්ව විශේෂයන් රැසක් හඳුනා ගැනීමට 2013 කැණීම් ව්‍යාපෘතියේ දී කටයුතු කරන ලද සත්ත්ව විශේෂඥයින් හා පර්යේෂකයින් සමත්ව තිබේ (ඇරැගම සහ සිරිසේන 2013: 18-20). මාංශමය ආහාර පරිභෝජනය කර ඇත්තේ පිළිස්සීමට ලක්කිරීමෙන් බව විශ්ලේෂණයෙන් අනුමාන කළ හැකි ය. කුරගල පර්යේෂණ කැණීමෙන් හමු වූ පුරාවිද්‍යාත්මක සාධක ප්ලයිස්ටෝසීන අවසන් සමයත් හොලෝසීන මුල් සමයත් නියෝජනය කරයි (Eregama & Perera 2016; ඇරැගම, 2017).

කුරගල ජනාවාස සංකීර්ණය මුහුදු වෙරළට කිලෝ මීටර් 65 කට ආසන්න බැවින් ඔවුන්ගේ යැපීම් රටාව ඉතාමත් පුළුල් ය. අනාවරණය කරගන්නා ලද අවශේෂ අතර සමුද්‍ර ජීවී කොටස් හඳුනාගෙන තිබේ. මින් පැහැදිලි වන්නේ ආහාර සඳහා මුහුදු ජීවීන් ද යොදාගත් බවකි (ඇරැගම සහ සිරිසේන 2013). කුරගල විසූ ප්‍රාග්ඓතිහාසික මානවයින් වැඩි වශයෙන්ම මිරිදිය හා ගොඩබිම වාසය කරන ලද ගොළුබෙල්ලන් ආහාරයට ගත් බවට අනුමාන කළ හැකි ය. ගොඩබිම් ස්ථානයන්ගේ වාසය කරන *acavidae, cyclophoridae* කුලයන්ට අයත් *Acavus, ayclophorus* ඝනයට අයත් වන්නා වූ ගොළුබෙල්ලන්, *thiaridae, ampullariidae, paludestrinidae, viraparidae* කුලයේ නියෝජනයන් පෙන්වන මිරිදිය ජීවත්වන්නා වූ *Paludomus, Pila, Pellimye* ඝනයේ ගොළුබෙලි විශේෂ කුරගල ජීවත් වූ මානවයින්ගේ ආහාර සංචිතයට ඇතුළත් බවක් අනුමාන කළ හැකි ය. කුරගල කැණීම් පරිශ්‍රයෙන් *ariophantidae,*

subulinidae, streptaxidae, corllidae, camaenidae, pupinidae යන කුල නියෝජනයන් පෙන්වන ඉතා කුඩා භෞමික ගොළුබෙල්ලන් රැසකගේ ශේෂයන් අනාවරණය කරගෙන තිබේ. සත්ත්ව අස්ථීන් පිළිබඳව කටයුතු කරන ලද ජූඩ් පෙරේරා හා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කැලුම් මනමේන්ද්‍ර ආරච්චි විසින් පහත කුලයන්ට අයත් සත්ත්ව විශේෂයන්ගේ අස්ථීන් හඳුනාගැනීමට ලක්කර තිබේ.

ප්‍රීමාට ගෝත්‍රයට (*primates*) අයත් වඳුරන්, හා රිලවුන්, මෙන්ම මාංෂභක්ෂකයින් (*carnivora*) වන කොළදිවියා, කලවැද්ද, මුගටියා, වැනි සතුන් ද, කුර සහිත සතුන් ද රොඩෙන්ටියා (*rodntia*) කුලයේ ඉත්තෑවා, දඬුලේනා, මීයා, ඌරු මීයා වැනි සතුන් ද කෘන්තකයින් වන (*chiroptera*) කෛරොප්ටෙරා කුලයේ මා වවුලා, හා වෙනත් වවුල් විශේෂයන්, ඉඩෙන්ටේටා (*edenteta*) ගෝත්‍රයේ කබල්ලෑයන්, වැනි සතුන්ගේ කොටස් බහුල වශයෙන් අනාවරණය වේ.

කුරගල විසූ ප්‍රාග්ඓතිහාසික මානවයින්ගේ ජීවන රටාවේ උරගයින් (*reptillia*) පිළිබඳව සිදුකරන ලද මූලික පර්යේෂණ අනුව පැහැදිලි වී ඇත්තේ, වැරනයිඩේ කුලයේ (*varanida*) තලගොයින්, කොකොඩයිඩ් කුලයේ (*crocodiylidae*) කිඹුලන්, එමිඩ් කුලයේ (*emydae*) ගල් ඉබ්බන්, ට්‍රයිනිචයිඩ් කුලයේ (*trionychidae*) කිරි ඉබ්බන් වැනි සතුන් ද ආහාර සඳහා භාවිතයට ගත් බවකි (Roberts et al., 2015: 1246-49; මනමේන්ද්‍ර ආරච්චි සහ තවත් අය 2016: 3-20; ඇරැගම 2017).

ප්‍රාග් ඓතිහාසික මානවයින් විසින් ස්ථිර වශයෙන්ම ආහාරයට ගන්නට ඇතැයි අනුමාන කරන තවත් එක් සත්ත්ව කාණ්ඩයක් වන්නේ පක්ෂීන් ය. ගැලිෆෝර්මස් (*galliformes*) ගෝත්‍රය නියෝජනය කරන්නා වූ පාසිනයිඩ් (*phasianidae*) කුලයට අයත් වලිකුකුලා, හා හබන් කුකුලා අහාරයට ගන්නට ඇති බවට විශ්වාස කරයි (Roberts et al., 2015: 1246-49; Eregama & Perera 2016; ඇරැගම 2017).

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයාගේ මාංශමය ආහාර ප්‍රමාණයට සමාන ආහාර ප්‍රමාණයක් ශාකමය ආහාර මගින් ලබාගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ප්‍රාග්ඓතිහාසික මානවයින්ගේ ශාකමය ආහාර රටාව පිළිබඳව වූ නිෂ්චිත සාධක සොයා ගැනීම බොහෝ අපහසු වී ඇත්තේ පවත්නා පරිසර තත්ත්වයන් මත විනාශයට පත්ව ඇති නිසාය (ඇරැගම 2017). කැකුණ, ගල් වෙරළු, වල් දෙල්, ඇටි කෙසෙල් වැනි ශාකයන්ගේ පිළිස්සුණු කොටස් වරින්වර ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානයන්ගේ සිදුකර ඇති කැණීම් මගින් අනාවරණය කරගෙන තිබේ (දැරණියගල 1991: 18-22; Adikari 1998; Perera 2010).

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයාගේ හැසිරීම් රටා හා සංස්කෘතිය

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයා අනිවාර්යයෙන්ම දියුණු සංනිවේදන ක්‍රමවේදයක් හා සංකේත භාවිත කර ඇත. එසේ නොවන්නට මෙලෙස කුටුම්භගත මිනිසෙක් බිහි නොවනු ඇත. සංකේතාත්මක අදහස් ප්‍රකාශනයක් හෝ ශබ්දයේ වෙනස්කම් භාවිතයෙන් අදහස් ප්‍රකාශනයක් සිදුවන්නට ඇත. විශේෂයෙන්ම ආහාර සොයායාම සඳහා මොවුන් සන්නිවේදන ක්‍රමවේද භාවිතා කළ බව නිසැක ය. කුරගල ප්‍රාග් ඓතිහාසික ස්ථානයෙන් අස්ථි කැබැල්ලක් මත සලකුණු කරන ලද යම් සටහනක් අනාවරණය වී ඇත. එහි රේඛා සටහන් ලෙසින් ඇති සංකේතයේ අර්ථය හෝ සන්නිවේදනය කිරීමට අදහස් කළ දෙය කුමක්දැයි වර්තාමානයේ අනුමාන කළ නොහැකි වුව ද යම් අදහසක් එහි අන්තර්ගත බව පැහැදිලි ය (Eregama & Perera 2016; ඇරැගම 2017).

කුරගල ප්‍රාග්ඓතිහාසික කැණීමෙන් හමු වූ සංකේතය කිසියම් අදහස් ප්‍රකාශ කිරීමේ කලාවක් සඳහා ඔවුන් විසින් භාවිතයට ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය (ඇරෑගම 2017). එහි දී යම් මානවයෙක් හෝ මානව කණ්ඩායමක් විසින් අදහසක් ප්‍රකාශ කිරීමට මෙම සංකේතය භාවිත කළා ද විය හැකි ය. එය යම් විටෙක යම් අත්දැකීමක සංකේතාත්මක ප්‍රකාශනයක් ද, එසේත් නොමැතිනම් යම් අගයක් ප්‍රකාශ කිරීමක් ද යන්න පිළිබඳව පැහැදිලි කිරීම අපහසු ය.

ආභරණ කලාව

ශ්‍රී ලංකාවේ නවීන මානව සාධක අදින් වසර 48,000 දක්වා පහතරට තෙත් කලාපයේ ගල්ලෙන්වලින් හමුව තිබේ (Perera 2010: 105; Deraniyagala 1984, 1992; Adikari 1998). සාමාන්‍යයෙන් ආභරණ පැළඳීම භාවිතයට පටන් ගැන්ම සිදුව ඇත්තේ ඉහළ පුරාශිලා යුගයේ දී ය. මෙම භාවිතයන් මධ්‍යශිලා යුගය වනවිට ඉතාමත් පුළුල් ආකාරයෙන් ක්‍රියාත්මක වී තිබේ. දකුණු ආසියානු රටවල් අතරින් පැරණිම නවීන මානව වාසභූමි පැවතුන රටක් ලෙසින් ශ්‍රී ලංකාව හඳුන්වාදිය හැකි ය. පාහියන්ගල 2009-2012 කැණීම් කාල සීමාවෙන් මතුකරගත් දත්ත මගින් අදින් වසර 47,000 පැරණි මානව ජනාවාස තොරතුරු හෙළිකරගෙන ඇත (Perera 2015: 105)' ප්ලයිස්ටෝසීන යුගයේ අග භාගය වනවිට ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික මානවයන්ගේ ආභරණ භාවිතය ඉතා පුළුල්ව හා සංකීර්ණව පැවති බවට කුරගල පාංශු සංදර්භයන්ගෙන් හමුව ඇති පබළු හා පළඳනා මගින් පැහැදිලි වේ.

කුරගල මානවයා ද පෞද්ගලිකව ආභරණ පළඳා විලාසිතාවන්ගේ යෙදුනේ විශේෂත්වයක් හැඟවීමට විය යුතු ය. කුරගල ලෙන් සංකීර්ණයේ සිදුකරන ලද පර්යේෂණ කැණීමෙන් මුහුදු බෙල්ලන්" සත්ත්ව අස්ථි, මිරිදිය හා ගොඩබිම බෙල්ලන්" ආදියෙන් පළඳනා සකසා ඇති බවට සාධක හමුව තිබේ (Eregama & Perera 2016; ඇරෑගම 2017). මෙලෙස සකසාගත් පබළු බෙල්ලේ හෝ අත්වල එල්ලා භාවිතයට ගතහැකි අයුරින් මධ්‍යය සිදුරු කර ඇති අතර ඒවා සඳහා කලාත්මක හැඩතලයන් ද එකතුකර තිබීම විශේෂත්වයකි. බොහෝ පබළු ස්වභාවිකව පවතින සිදුරු උපයෝගී කරගෙන හැඩතලයක් මතුවන තෙක් අවශ්‍ය පරිදි උරච්චිකර නිර්මාණයකර ගන්නට ප්‍රාග්ඓතිහාසික මානවයා දස්කම් දක්වා තිබීම ඔවුන්ගේ චින්තනය පිළිබඳව වටහා ගැනීමට උපකාරකයකි (විශේෂයෙන්ම *Species: C. darkini* භාවිතයෙන් සැකසූ පෙති පබළු)' තවත් ඒවා යම් උපකරණයක්, උලක් හෝ අං භාවිතයෙන් සිදුර කර භාවිතයට ගෙන තිබේ. මොවුන් පෞද්ගලිකව ආභරණ භාවිතා කිරීම හා නිෂ්පාදනය පිළිබඳව විශේෂ පරිචයක් ළඟා කරගෙන තිබේ.

කුරගල ප්‍රාග්ඓතිහාසික මානව සමාජය තුළ ද මෙලෙසින් විවිධ වූ ද විශේෂ වූ ද ආභරණ පැළඳීම සංකේතාත්මකව ඒ ඒ පුද්ගලයා සුවිශේෂී වීමට ගත් උත්සාහයක් විය හැකි ය. ගල් කුට්ටි මත වකුටු කර වළ දමා තිබූ කුරගල මානව අස්ථි සැකිල්ල ආසන්නයේ ද පබළු කීපයක් හමුවීමෙන් මෙම තත්ත්වය වඩාත් පැහැදිලි වේ (Eregama & Perera 2016; ඇරෑගම 2017). ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ඛනිජ ද්‍රව්‍යකින් නිමවූ පබළුවක් හමු වීම විශේෂත්වයක් ගනී. මිනිරන් ඛනිජය භාවිතා කරමින් මධ්‍යය සිදුරු කර උරච්චිකිරීමෙන් මෙම පබළුව නිර්මාණය කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. සංදර්භ 46 තුළින් අනාවරණය කරගෙන ඇති මෙම පබළුව අදින් වසර 15,000 සීමාවේ දී නිර්මාණය වී ඇත (Eregama & Perera 2016; ඇරෑගම, 2017). තව ද කිඹුල් දතකින් නිර්මාණය කර ඇති සිදුරු සහිත පළඳනාව ද කුරගල කැණීමෙන් අනාවරණය කරගෙන ඇති සුවිශේෂී ආභරණයකි (ඇරෑගම, 2017). මෙහි එක් පසක පමණක් සිදුර මතුව ඇති අතර අනෙක් පස සිදුර පාෂාණීභූත ද්‍රව්‍යන්ගෙන් ආවරණය වී තිබේ. කුරගල මානවයාගේ ආභරණ භාවිතය ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රාග්ඓතිහාසික ජනාවාස හා සංසන්දනයේ දී ඉහළ අගයක් ගන්නා බැව් පැහැදිලි ය.

7 රූපය කුරගලින් අනාවරණය වූ පබළු සංස්කෘතිය



වර්ග මීටර් 6 ක් වූ කුඩා වපසරියකින් පබළු හා ආභරණ 80 කට ආසන්න සංඛ්‍යාවක් හමුවීමෙන් මේ බව තහවුරු වේ (Eregama & Perera 2016; ඇරේගම 2017). මෙහි නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳව විශ්ලේෂණාත්මකව පිරික්සීමේ දී පැහැදිලි වන්නේ ස්වභාවික බෙල්ලන් තම අවශ්‍යතාවය පරිදි කොටස්කර භාවිතයට ගෙන ඇති බවකි. විශේෂයෙන්ම මුහුදු ආශ්‍රිතව ජීවත්වන කේතු බෙල්ලන් (*Cone snails*) භාවිතයෙන් නිර්මාණය කර ඇති පබළු බොහෝමයක ඇත්තේ ස්වභාවිකව පැවතුන සිදුරු විශාලකර භාවිතයට ගැනීමකි. අනෙකුත් පබළු සඳහා එම මානවයින් විසින් සිදුරු අවශ්‍යතාවය මත අවශ්‍ය ස්ථානයට යොදා තිබේ.

කුරගල ප්‍රාග්ඓතිහාසික ජීවන රටාවේ ඉදිකිරීම් තාක්ෂණය, ගින්දර හා ලුණු භාවිතය

ප්ලයිස්ටෝසීන අග වරින්වර ඉදිකිරීම් තාක්ෂණයේ හෝඩුවාවන් කීපයක් ශ්‍රී ලංකාවේ පර්යේෂණයන්ගෙන් මතුව තිබේ. පළමු වතාවට සක්ක ගල් බැම්මක ඉදිකිරීම් ව්‍යුහයක් කෑගල්ල කිතුල්ගල බෙලිලෙන ප්‍රාග් ඓතිහාසික කැණීමෙන් අනාවරණය කරගෙන තිබේ (දැරණියගල 1991:22). ඉන්පසුව ඉදිකිරීම් තාක්ෂණයේ ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරකමක හෝඩුවාවක් පාහියන් ලෙන කැණීමෙන් පැහැදිලි කරගෙන තිබේ. පාහියන් ලෙන මානවයා තම වාසභූමිය ක්‍රමවත්ව සකසා ගන්නට ගල් කුට්ටි ක්‍රමවත්ව අසුරා පස විසිරයාම වළක්වාගෙන තිබූ බවට වූ තොරතුර ඉතාම වැදගත් ය.

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයා විසින් ද ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳව වූ හෝඩුවාවක් ඉතිරි කර ඇති බව 2013 කැණීම් වාරයේ දී අනාවරණය කරගෙන තිබේ. සංදර්භ අංක 40 ලෙසින් හඳුනාගන්නා ලද පාෂාණ උද්ගතයන් දෙක අතර වූ හිඩැසක් සක්ක ගලින් පුරවා අනෙක් පස භූමියේ පස් රූරා වැටීම වළක්වාගෙන ඇත්තේ සංදර්භ අංක 48 දරන ස්තරය මගින් ය (Eregama & Perera 2016; ඇරැගම 2017). තරමක් විශාල ගල් කුට්ටියක් පළමුව හරස්කර අනෙකුත් හිඩැස් සඳහා කුඩා ගල් කැබලි රඳවා තිබූ බව අනාවරණය කරගෙන තිබේ (ඇරැගම සහ සිරිසේන 2013: 18-20).

8 රූපය මානව ක්‍රියාකාරකම් - ඉදිකිරීම්

කුරගල ප්‍රාග්ඓතිහාසික ජනාවාස පාංශු සංදර්භයන් සියල්ලගේම පාහේ ගින්දර භාවිත කළ බවට වූ අඟුරු අනාවරණය කරගෙන තිබේ. මේ අනුව, ආහාර පුලුස්සා ගැනීමට" ලෙන් පරිසරයේ උණුසුම රඳවා ගැනීමට" රාත්‍රියට ආලෝකය ලබාගැනීමට, වන සතුන්ගේ ආරක්ෂාවීමට" ශිලා මෙවලම් නිෂ්පාදනය පහසු කරගැනීමට ගින්දර භාවිත කරන්නට ඇත.

ලෙන පරිශ්‍රය අභ්‍යන්තරයේ ගිනිදැල්වීමෙන් අනතුරුව එය නොනිමී තබා ගැනීමට විවිධ උපක්‍රම භාවිත කරන්නට ඇත. පැහැදිලි ලෙසින්ම ගිනි උදුනක් පවත්වාගෙන ආ බවට කුරගල ප්‍රාග් ඓතිහාසික සංදර්භයන්හි අංක 47 සාධක සපයයි. එම ස්ථානයේ පොළව අධික රස්නයට පිළිස්සී රත් පැහැගෙන තිබේ (ඇරැගම සහ සිරිසේන 2013:18-20; Eregama & Perera 2016; ඇරැගම 2017).

ප්ලයිස්ටෝසීන යුගය මුල්කර ගනිමින් විවිධ ස්ථානයන්හි සිදු කරන ලද බොහෝ ප්‍රාග්ඓතිහාසික කැණීම් පර්යේෂණ තොරතුරු ලුණු භාවිතය පිළිබඳ හෝඩුවාවන් ලබා දේ. ශ්‍රී ලංකාවේ මෙතෙක් කැණීම් සිදු කරන ලද කුරුවිට බටදොඹලෙන, හොරණ පාහියන්ගල, කිතුල්ගල බෙලිලෙන, බෙල්ලන්බැඳි පැලැස්ස හා අලවල වැනි ස්ථානයන්ගෙන් හමුව ඇති

ලුණු බෙල්ලන්ගේ අවශේෂයන්ගේ සාක්ෂි පවතී (Perera 2010: 186). යම් විටක මුහුදු සීමාවෙන් රැගෙන එන වෙනත් ද්‍රව්‍ය හරහා මෙම ලුණු බෙල්ලන් ද පැමිණීමට ඉඩකඩ පවතී.

ලුණු රසය දිවට හුරු වූ ප්‍රාග්ඓතිහාසික මානවයින් ගොඩබිම සිට මුහුද දෙසට සංචරණයේ යෙදෙමින් තම අවශ්‍යතාවයන් පිරිමසාගත් බවක් පිළිගත හැකි ය. කුරගල කැණීම් පරිශ්‍රයෙන් මුහුද ආශ්‍රිත සම්පත් සාධක රැසක් අනාවරණය වූ අතර ලුණු භාවිතය පිළිබඳව ඍජු සාධකයන් හමු නොවුණ ද අනෙකුත් මුහුදු ජීවී ශේෂිතයන් සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීමෙන් මෙම මානවයින් ද ලුණු භාවිතයට ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

මත්ස්‍ය ආහාර හා මුහුදු සබඳතා

භෞතිකමය වශයෙන් ඔප්පු කළ හැකි මුහුදු ජීවී සාධක තොරතුරු අදින් වසර 40,000 කට පෙර සිට පමණ පවතින බව අනාවරණය කරගෙන තිබේ (Perera 2015: 104-117). කුරගලින් අනාවරණය කරගන්නා ලද සංදර්භ 49 කට ආසන්න තැම්පතු මගින් මුහුදු මත්ස්‍ය අවශේෂ හමුවීමෙන් පැහැදිලි වන්නේ එම ප්‍රාග්ඓතිහාසික මානවයින් මුහුද සීමාව සමග සමීප සබඳතාවයන් පවත්වා ඇති බවකි (Eregama & Perera 2016; ඇරැගම 2017). මධ්‍ය වලව නිම්නය හරහා මුහුදු සීමාවට කිලෝ මීටර් 65 ක පමණ දුරක් ගමන් කළ යුතු වුව ද, එම අභියෝගය ප්‍රාග්ඓතිහාසික මානවයින් විසින් ජයග්‍රහණය කර තිබෙන බවක් හමුවන මුහුදු අවශේෂයන්ගෙන් පැහැදිලි ය. විශේෂයෙන්ම කැණීමෙන් අනාවරණය කරගන්නා ලද පබළු වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇත්තේ මුහුදු ජීවීන් භාවිතයට ගනිමිනි.

අභිචාර

කුරගල ලෙන් කැණීමෙන් අනාවරණය කරග්නා ලද අස්ථි සැකිල්ල ප්‍රාග්ඓතිහාසික අභිචාර විධි ලෙසින් මළවුන් අදහන්නට ඇති බවට වූ සාක්ෂියකි. අංක 8 සංදර්භයෙන් අස්ථි සැකිල්ල අනාවරණය වී තිබේ (Eregama & Perera 2016; ඇරැගම 2017). උරච්චි කරන ලද ගුරුගල් කොටස් විශාල ප්‍රමාණයක් අනාවරණය කරගැනීමට හැකිවීමෙන් පැහැදිලි වන්නේ එවැනි අභිචාර විධි පැවති බවට ඉඟියක් විය හැකි ය. මිනිසා මියගිය පසු ඔහු හෝ ඇය වෙනුවෙන් කළ හැකි උපරිම අගය කිරීම හා ගෞරවය ලෙසින් මියගිය අය ක්‍රමවත් ලෙසින් ආදාහනය කිරීමට ප්‍රාග් ඓතිහාසික මානවයා හුරුවූයේ කෙදිනක සිටදැයි මෙතෙක් නිරවුල් හා නිශ්චිත සාධක නැත. කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයා කළල ස්වරූපී අයුරින් මිහිදන්කර තිබූ බව අනාවරණය කරගෙන තිබේ.

මතුකර ගන්නා ලද අංක 8 සංදර්භයේ වූ කුරගල ප්‍රාග්ඓතිහාසික මානව අස්ථි සැකිල්ල මතුපිට සිදුරු සහිත ඇඹරුම් ගල් කීපයක් අතුරා තිබී ඇත. එමෙන්ම ගල් කුට්ටි කීපයක් මත කළල ස්වරූපී ලෙසින් මෙම මිහිදන් කිරීම සිදුකර ඇත්තේ තරමක් ඊසාන දෙසට හැරෙන අයුරින්ය. දැනට හෙළිකර ගන්නා ලද හා අනුමාන කරනු ලබන ප්‍රාග් ඓතිහාසික මානව වළදැමීම් සිදු කරන ලදැයි සිතිය හැකි ක්‍රමවේදයන් දෙකකි. එනම් ප්‍රාථමික (Primary) වළදැමීම් හා ද්විතීයික (Secondary) වළ දැමීම් ය. ප්‍රාථමික වළදැමීමක දී එම ස්ථානයේ දී වැළලීම සිදුවන අතර, ද්වීතීක වළදැමීමක දී වෙනත් ස්ථානයක අස්ථි සැකිල්ලේ මස් දියවෙන්නට හැර පසුව ගෙනවිත් වළදැමීම සිදු කරයි. කුරගල මානවයා එම ස්ථානය තුළදීම වළදැමීම සිදුකර ඇති බවක් අනුමාන කෙරේ (Eregama & Perera 2016; ඇරැගම 2017).

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයින්ගේ තියුණු නුවණ සහ හැකියා

සමස්ත ඇඟිලි සමග අත්ල භාවිතයට ගෙන බල ග්‍රහණයක් ඇති කිරීමේ හැකියාව සත්ත්ව ලෝකයේ බොහෝ දෙනකුට පවතී. මෙය බල ග්‍රහණය (power grip) ලෙසින් හැඳින්වේ. වානරයින් වැඩි වශයෙන්ම බල ග්‍රහණය තුළින් අවශ්‍යතාවන් පිරිමසා ගනිති. එහෙත් මිනිසාගේ පරිණාමයත් සමග බල ග්‍රහණය නිරවද්‍ය ග්‍රහණය (precision grip) දක්වා වෙනස් වී පසුව මෙම දෙකම සම්මිශ්‍රණය කර භාවිතකර තිබේ. නිරවද්‍ය ග්‍රහණය යනු ඇඟිලි හෝ ඇඟිලි තුඩු භාවිතයට ගනිමින් යමක් ග්‍රහණය කරගනිමින් ක්‍රියාකාරකම් කිරීමයි.

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයින් විසින් වැඩි වශයෙන් ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම් නිෂ්පාදනයේ දී ඉතාම කුඩා මිටි (Hammer stone) භාවිතාකර ඇති බව අනාවරණය විය. මෙතෙක් ශ්‍රී ලංකාවේ එවැනි කුඩා මිටි භාවිතයන් පිළිබඳව වාර්තා වී නොමැත. තව ද ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම් නිෂ්පාදනයේ දී මෙන්ම එම ආයුධ නැවත හැඩගැසීම්, යළි සැකසීම් (Retouch), මොට කිරීම් (Backing), හැඩ ගැසීම් (Trimming) යනාදියේ දී තියුණු නුවණ සහ හැකියා ප්‍රබල ලෙසින් දයක වී තිබේ. මෙයින් පැහැදිලි වන්නේ ප්‍රාග්ඓතිහාසික මානවයින්ගේ ජීවන රටාවේ තාක්ෂණික වපසරිය සාර්ථක කරගන්නට තියුණු නුවණ, බලග්‍රහණය, සහ නිරවද්‍ය ග්‍රහණය ඉතාම වැදගත් වී ඇති බවකි.

සංචරණය ප්‍රිය කළ කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයා

ප්‍රධාන නියමයන් දෙකක් ලෙසින් හැඳින ගන්නා පරිදි මුල්ම මානවයින් දකුණු අප්‍රිකාවෙන් බිහි වූ බව හා තවත් දකුණු අප්‍රිකානු විවිධ ප්‍රදේශ මුල්කර ගනිමින් මිනිසුන් බිහි වූ බවත් පිළිගනු ලබයි. දකුණු අප්‍රිකාවෙන් නික්මීමේ න්‍යාය ඔස්සේ එම මානවයින් ලොව පුරා ව්‍යාප්තව ගිය බවට බොහෝ සාධක මේ වනවිට අනාවරණය කරගෙන තිබේ (O’Connor & Chappell 2003: 15-32). නවීන මානවයා පිළිබඳව ශ්‍රී ලාංකේය සාධක වැඩිවශයෙන්ම රැඳී ඇත්තේ තෙත් කලාපයේ ගල් ලෙන් ආශ්‍රිතව හා වියළි කලාපයේ ගල්ලෙන්හි පස් ස්තර තුළ ය. දකුණු අප්‍රිකාවෙන් නික්මීමේ න්‍යායාත්මක පදනම ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික ස්ථායන්ගෙන් මේවනවිට තහවුරු වී තිබේ.

මේ සඳහා ස්වභාව ධර්මයේ හේතූන් කීපයක් සුබවාදී ලෙසින් වරින්වර සිදු වී තිබූ බව පැහැදිලි කරගෙන තිබේ. විශේෂයෙන්ම මහද්වීප තරණයේ දී වර්තමානයේ දැකිය හැකි සාගර, අවස්ථා කීපයකදීම ගොඩබිම් සමඟ යාව තිබූ බව සොයාගෙන තිබේ. එම ගොඩබිම් යාව තිබුණ යුගයන් භූ විද්‍යාඥයන් විසින් හිම යුග (ice ages) ලෙසින් හඳුන්වන ලදි. මෙම යුගයන්හි දී ප්‍රාග්ඓතිහාසික මානවයා විසින් තමාට රිසි පරිසරය සොයා සංචරණයේ යෙදෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. අදින් වසර 7000 කට පමණ පෙර මහාද්වීප ජ්ලාවිතය සමඟ ශ්‍රී ලංකාව ඉන්දියාව හා ගොඩබිමෙන් යාව තිබූ බව පැහැදිලි කරගෙන තිබේ (දැරණියගල 1992: 134).

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයා ද දුරස්ථ ස්ථානයන්හි සිට භාණ්ඩ හුවමාරුව අඩුම තරමින් කිලෝ මීටර් 65 කට ආසන්න දුරක සිට සිදු කරන්නට ඇතැයි හමුවන ආගන්තුක ශේෂිත ද්‍රව්‍යාත්මක නියෝජනයෙන් පැහැදිලි ය. විශේෂයෙන්ම දිය හා ගොඩ මුහුදු බෙල්ලන්, මත්ස්‍ය විශේෂයන්, අමුද්‍රව්‍ය ලෙසින් කහඟ, තිරුවානා වැනි ද්‍රව්‍ය දුරස්ථ ප්‍රදේශයන්හි සිට ප්‍රාග්ඓතිහාසික මානවයින් විසින් මෙම ස්ථානයට ගෙනෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. කුරගල ප්‍රාග්ඓතිහාසික මානව ජනාවාස සමය වූ ජ්ලයිස්ටෝසීනයේ අගභාගය වනවිට අමුද්‍රව්‍ය හා භාණ්ඩ හුවමාරුව සඳහා ඒ ඒ ජන කොට්ඨාසයන් අතර අභ්‍යන්තරව විහිදුණු ජාලගත ක්‍රමවේදයක් (internal network) පැවති බවක් මින් අනුමාන කළ හැකි ය. කුරගල ප්‍රදේශයේ සිට උඩවලව හරහා මුහුදට ගලායන වලවේ ගඟේ කිලෝ මීටර් 65 කට ආසන්න

දුරක් සංචරණයේ යෙදෙමින් ආහාර හා ලුණු වැනි දෑ ගෙනවිත් ඇතිබව මෙමගින් අනුමාන කළ හැකි ය. මීට අමතරව කැකුණ වැනි ශාකයන් කුරගල ප්‍රදේශයෙන් හමුවීමෙන් අනුමාන කළ හැක්කේ එම ද්‍රව්‍ය තෙත් කලාප පරිසරයන්ගෙන් රැගෙන එන්නට ඇති බවකි. මීට අමතරව අකාවුස් සණයේ ගොළුබෙල්ලන් කුරගල ස්ථානයෙන් හමුවීමෙන් අනුමාන කළ හැකි වන්නේ ද එම සත්ත්ව කාණ්ඩයන් තෙත් කලාපයේ සිට මෙම ස්ථානයට රැගෙන ආ බවකි (Eregama & Perera 2016; ඇරැගම 2017).

මෙවලම් භාවිතය

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයාගේ ජීවන රටාව පවත්වා ගැනීම වෙනුවෙන් භාවිතයට ගන්නා ලද හා ගල් උපයෝගී කරගෙන නිර්මාණය කරන ලද ආයුධ සියල්ල "ශිලා මෙවලම්" ලෙසින් හැඳින්විය හැකි ය. රවුම් හැඩැති ඛනිජ කුට්ටියකින් මුවහත ඇති සැහැල්ලු ශිලා පතුරක් ඉවත්කර මෙවලමක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය ශිලා මෙවලම් තාක්ෂණය ලෙසින් සරලව හැඳින්විය හැකි ය.

ශිලා මෙවලම් තැනීම පිණිස යොදගත හැකි යෝග්‍ය ඛනිජය හෝ පාෂාණය තෝරා ගැනීමත්, එලෙස තෝරා ගන්නා ලද ඛනිජ හෝ පාෂාණ කුට්ටිය විවිධ වූ තාක්ෂණික ක්‍රම භාවියතට ගෙන පතුරු ඉවත්කර අවශ්‍යතාවයට උචිත අයුරින් කපා ගැනීමට, සීරීමට, උල් කිරීමට හෝ වෙනත් අවශ්‍යතාවයකට මුවහත් ලෙස සකසා ගැනීම ශිලා මෙවලම් තාක්ෂණය තුළින් සිදුවෙයි.

කුරගල ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් විසූ ප්‍රාග්ඓතිහාසික මානවයා සිය ජීවනෝපාය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට භාවිතා කරන ලද එක් තාක්ෂණික ක්‍රමෝපායක් වූයේ මෙම ශිලා මෙවලම් තාක්ෂණයයි (Eregama & Perera 2016; ඇරැගම 2017). මෙරට විසූ අනෙකුත් ප්‍රාග්ඓතිහාසික මානව ජනාවාසයන්හි ජීවත් වූ මානවයින් මෙන්ම කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයාගේ ශිලා මෙවලම්හි නිපයුම් මූලද්‍රව්‍ය වූයේ තිරුවානා, කහඳ හා වෙනත් ශිලා මූලයන්ය (Eregama & Perera 2016; ඇරැගම 2017). කුරගල කැණීම් සංදර්භයන්ගෙන් මතුකර ගන්නා ලද ශිලා මෙවලම් ප්‍රමාණයට අමතරව තවත් විශාල ප්‍රමාණයක් අපද්‍රව්‍ය හා ශිලා මෙවලම් විය හැකි පතුරු මෙන්ම ශිලා පතුරු ලෙසින් විශ්ලේෂණයෙන් හඳුනාගෙන තිබේ.

ශිලා මෙවලම් නිෂ්පාදනය සඳහා යොදගත් මිටි ගල්

ශිලා මෙවලම් නිෂ්පාදනයේ දී මිටි ගලක් ලෙසින් හඳුන්වනු ලබන්නේ න්‍යෂ්ටියක් මතට ප්‍රහාරයක් එල්ලකර අවශ්‍ය ප්‍රමාණයට පතුරක් ඉවත්කර ගැනීමට ප්‍රමාණවත් තරම් රවුම් හා දික් හැඩැති බෝලගලකට ය. මිටි ගලක ලක්ෂණයන් ලෙසින්, තැලීමේ දී හටගත් සලකුණු, පතුරු ගැලවීයාමේ සලකුණු, තැලීමෙන් මොට වූ සලකුණු ආදිය දැක්විය හැකි ය.

බෝලගලක් ශිලා මෙවලම් නිෂ්පාදන මිටියක් සේ භාවිතා කළේ යැයි සොයාගතහැකි ලක්ෂණ ගණනාවකි. ගංගාවකින් හෝ දිය පහරකින් ගෙනෙන ලද බෝල ගලක අග්‍රයේ රවුම් කෙළවර ගල් මිටියක් සේ භාවිතයට ගෙන භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් එහි කෙළවර කඩතොලුවීම් දැකගත හැකි ය. බොහෝවිට කඩතොලු වී පතුරු ඉවත් වූ අවස්ථා ද දකගත හැකි ය. තැලීමට හා පහරදීමට බඳුන්වීමෙන් ගෙවී ගොස් තිබෙන අවස්ථා ද දැකගත හැකි ය. මිටියක් වශයෙන් යොදාගත් රවුම් ගල ශක්තිමත් නොවුවහොත්, න්‍යෂ්ටියට පහර එල්ල කිරීමේ දී එහි මතුපිටින් කුඩා පතුරු ඉවත්විය හැකි ය. කුරගල කැණීම් සංදර්භවලින් භාවිතයට ගන්නා ලද මිටි ගල් හා කැඩීගිය ගල් හමුව තිබේ (Eregama & Perera 2016; ඇරැගම 2017). කුරගල ප්‍රාග් ඓතිහාසික කැණීම් සංදර්භයන් මතින් මිටි වශයෙන් භාවිතයට ගන්නා ලද ඉතාමත් කුඩා

බෝලගල් අනාවරණය කරගෙන තිබීම සුවිශේෂී තත්ත්වයකි (Eregama & Perera 2016; ඇරැගම 2017). මෙතෙක් එවැනි කුඩා ප්‍රමාණයේ බෝලගල් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණවලින් අනාවරණය වී නැති බව වාර්තා පිරික්සීමෙන් පැහැදිලි වේ.

ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම්

ශිලා මෙවලම් පිළිබඳව අධ්‍යයනයේ දී ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍රශිලා මෙවලම් ලෙසින් හඳුනාගනු ලබන්නේ ඉතා කුඩා ශිලා මෙවලම් විශේෂයකට ය. එම ශිලා මෙවලම් සියල්ලක්ම පාහේ දිගින් සෙන්ටි මීටර් හතරක් හෝ ඊට වඩා අඩු ය. මෙම ශිලා මෙවලම්හි විශේෂත්වය වන්නේ නිශ්චිත ජ්‍යාමිතික හැඩයකින් යුතු වීමය. කුරගල කැණීමෙන් හෙළිකර ගන්නා ලද දත්ත මුල් කරගනිමින් සිදුරන ලද මූලික නිරීක්ෂණයන්ගෙන් අනාවරණය කරගන්නා ලද ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම් පහත අයුරින් හඳුන්වාදිය හැකි ය.

මෙම මෙවලම්හි යම් ජ්‍යාමිතික හැඩතලයකට හිමිකම් කියන්නා වූ ශිලා මෙවලම් මෙන්ම එවැනි ආකාර හා තවත් එවැනිම හැඩතලයන් සහිත මෙන්ම හඳුනා නොගත් හැඩයන්ගෙන් යුතු ය. ඒ සියල්ලක්ම නිපදවා ඇත්තේ "පළිගු" ඛනිජය හෝ "තිරුවානා" පාෂාණ උපයෝගී කරගෙන ය. ඉතාමත්ම කලාතුරකින් කහඳ පාෂාණයෙන් නිපදවා තිබෙනු දැකගත හැකි ය. ඉතා සුමට කුඩා වූ මෙම මෙවලම් එම මානවයින් විසින් කැපීම, ඉරීම, සීරීම, සහ විදීම සඳහා භාවිතයට ගෙන ඇති බවක් අනුමාන කළ හැකි ය. දිගු කලක් තිස්සේ භාවිතයට ගන්නා ලද හා "නැවත හැඩ ගැසූ" ශිලාමෙවලම් ද "ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම්" එකතුවේ හඳුනාගෙන තිබේ. මෙම ස්ථානයෙන් ලීයක රඳවා භාවිතයට ගන්නට ඇතැයි අනුමාන කළ හැකි සාධක සහිත කහඳ පාෂාණයෙන් නිර්මිත ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලමක් අනාවරණය වී තිබේ (Eregama & Perera 2016; ඇරැගම 2017).

අස්ථි මෙවලම් තාක්ෂණය

කුරගල විසූ ප්‍රාග්ඓතිහාසික මානවයන් ශිලා මෙවලම් භාවිතයට අමතරව මෙවලම් ලෙසින් සත්ත්ව අං කැබලි" සත්ත්ව අස්ථි කැබලි" බෙලි කටු" මත්ස්‍ය කටු ආදියෙන් සකස් කරගත් උපකරණ භාවිතයට ගෙන තිබේ. මේවා අස්ථි මෙවලම් ලෙසින් පුරාවිද්‍යාවේ දී හඳුනාගනු ලබයි. යම් සත්ත්වයෙකුගේ අස්ථියක් සුමටකර එය වෙනත් කාර්යයක් කළ හැකි මෙවලමක් දක්වා සංවර්ධනය කිරීම අස්ථි මෙවලම් තාක්ෂණය තුළින් සිදු වේ. ස්වභාවිකව පවතින අස්ථියක් මානව මැදිහත් වීමකින් වෙනස් කිරීමකට ලක්කර මෙවලමක් බවට පත්කිරීම මේ තුළින් සිදු වේ.

කුරගල කැණීමෙන් මතුකරගන්නා ලද අස්ථි මෙවලම් මතුපිට තරමක් රළු ස්වරූපයක් ගැනීමට හේතු වී ඇත්තේ පැවති පාංශු සංදර්භයන්ගේ පවතින රසායනික සංයුතීන්වල වෙනස්කම් නිසා විය හැකි ය. එක් පසක් උල් කරන ලද අස්ථි මෙවලම් සේම දෙපසම උල්කරන ලද ආයුධ ද කුරගල ප්‍රාග්ඓතිහාසික මානව මෙවලම් ගොන්නේ පවතී (ඇරැගම සහ සිරිසේන 2013: 18-20; ඇරැගම 2017).

මෙවලම් භාවිතයට ගනිමින් මොවුන් විවිධ අවශ්‍යතාවයන් සපුරාගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. විශේෂයෙන් ඊ තුඩු ලෙසට, බෙල්ලන්ගේ අභ්‍යන්තර මාංශ කොටස් ඇද ගැනීමට, උපකරණ ලෙසට, විවිධ සතුන්ගේ මස් පිළිස්සීමට ආධාරක ලෙසින්, බිලී කොකු ලෙසට භාවිතයට ගන්නට ඇත.

9 රූපය කුරගල අස්ථි මෙවලම්

කුරගල මානවයා භාවිතයට ගෙන ඇති පාෂාණ හා ඛනිජ

දැඩියාව (Hardness) ඉතා ඉහළ අමුද්‍රව්‍ය ශිලා මෙවලම් නිපදවා ගැනීම සඳහා භාවිතයට ගෙන තිබේ. කුරගල විසූ ප්‍රාග්ඓතිහාසික මානවයන්ගේ ජීවන රටාවේ එක අංගයක් ලෙසින් ශිලා මෙවලම් නිපදවීම දැකගත හැකි ය. ශිලා මෙවලම් සෑදීම සඳහා පෘථිවි පෘෂ්ටය මත ඇති සෑම ඛනිජයක්ම හෝ පාෂාණයක්ම භාවිත කර නොමැති බව පැහැදිලිය.

ප්‍රාග්ඓතිහාසික පුරා සංදර්භයන් ගතහොත් බහුලවම දැකගත හැකි වන්නේ ශිලා මෙවලම් ය. ඊට ප්‍රධානතම හේතුවක් වන්නේ අනිකුත් ද්‍රව්‍යන් අතරින් කල් පැවැත්මේ ගුණය වැඩි වශයෙන්ම ඇත්තේ ශිලා මෙවලම්වල වීම ය. ශිලා මෙවලම් නිපදවීම සඳහා අමු ද්‍රව්‍ය තෝරා ගැනීම තීරණය කරන ප්‍රධානතම නිර්ණායකයන් කීපයකි. එනම් ලබා ගැනීමේ පහසුව, එල ප්‍රයෝජන ගත හැකි පාෂාණයට පිවිසීමේ හැකියාව, අපේක්ෂිත ශිලා මෙවලම නිෂ්පාදනය කිරීමේ හැකියාව මේ අතරින් ප්‍රධාන ය. ඉතාමත් මටසිලිටි පාෂාණ සැකැස්මක් සහිත, දැඩියාවක් ඇති පාෂාණ ඉතා පහසුවෙන් අවශ්‍ය ආකාරයට පැල්ම සිදුවන බැවින් ශිලා මෙවලම් නිෂ්පාදනයට සුදුසුකම් ලබයි.

ස්වාභාවික ඛනිජ වර්ණ භාවිතය

කුරගල විසූ ප්‍රාග්ඓතිහාසික මානවයින් නවීන මානව සංලක්ෂණ සහිත පිරිසක් බැව් පැහැදිලිව අනාවරණය වී ඇත. කුරගල ප්‍රාග් ඓතිහාසික මානවයින් භාවිතයට ගන්නා ලද වර්ණ ආලේපන මාධ්‍ය අතර හිරිගල් (ගුරුගල්), මිනිරන්, වැනි ස්වභාවික වර්ණ සහිත ඛනිජ ඉතා වැදගත් ය. කුරගල කැණීම් පරිශ්‍රය තුළින් හිස් කබල් හෝ අස්ථි කොටස් මත වර්ණ ගැන්වූ සාධක හමුනොවුණ ද භාවිතයට ගන්නා ලද රතු, කහ, සුදු හා මිනිරන් අනාවරණය වී තිබේ (ඇරෑගම සහ සිරිසේන 2013: 26-28; Eregama & Perera 2016; ඇරෑගම 2017). භාවිතයට ගන්නා ලද ගුරුගල් හා මිනිරන් සැලකිය යුතු ප්‍රමාණයක් කුරගල කැණීම් පරිශ්‍රයෙන් හමුවීමෙන් ඔවුන්ගේ ජන ජීවිතයේ පැතිකඩක් අනාවරණය කරගත හැකි ය. ස්වභාවික ඛනිජ කුට්ටි වෙනත් පාෂාණ කුට්ටියක් මත උරච්චි කිරීමෙන් වර්ණ සකසා ඇති බව පැහැදිලි ය (Eregama & Perera 2016; ඇරෑගම 2017).

10 රූපය ගුරුගල් ආලේපන හෝ වෙනත් ද්‍රව්‍ය

කැණීම් මගින් අනාවරණය වූ කුරගල මානව අස්ථි සැකිල්ල

අදින් වසර 7189 කට නිෂ්චිතව දිනවකවානු ලැබී ඇති පාංශු සංදර්භයකින් නවීන මානවයකුගේ (*Homo sapiens*) සම්පූර්ණ අස්ථි සැකිල්ලක් අනාවරණය වී ඇත (Eregama & Perera 2016; ඇරෑගම 2017). අතරමැදි කලාපයේ පවතින දේශගුණ කාලගුණ පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙමින් වසර 8000 කට ආසන්න කාලයක් ආරක්ෂිත වූ මානව අස්ථි සැකිල්ල ඉහත කී පාරිසරික තත්ත්වයන් නිසාම කැබලි ස්වරූපයට පත් වී ඇත.

මිහිදන්කර තිබූ මෙම අස්ථි සැකිල්ල නවීන මානවයාගේ අවමංගල චාරිත්‍ර පිළිබඳව සාධක රැසක් හෙළිකරනු ඇත. අභිචාර ක්‍රමයක් ලෙසින් අනුමාන කළ හැකි සේ හිස ප්‍රදේශයට ගල් කුට්ටි තුනක් තබා ශිලා මෙවලම් අස්ථි සැකිල්ලට ඉහළින් තැම්පත්කර තිබූ බවක් මූලික පර්යේෂණවලින් හෙළිකරගෙන තිබේ (Eregama & Perera 2016; ඇරෑගම 2017).

11 රූපය මානව අස්ථි සැකිල්ල 8 සංදර්භය

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික මානවයාගේ හැඩහුරුකම් හා ගති ලක්ෂණ ආදිය K.A.R. Kennedy විසින් විශ්ලේෂණයකර තොරතුරු ඉදිරිපත්කර තිබේ (Kennedy 1965). ප්‍රාග් ඓතිහාසික පිරිමි මානවයෙක් සාමාන්‍ය වශයෙන් සෙන්ටි මීටර් 174 ක් ද, ගැහැණියක සාමාන්‍ය වශයෙන් සෙන්ටි මීටර් 166 ක් ද ලෙසින් හඳුනාගෙන තිබේ.

අස්ථි සැකිල්ල ගල් කුට්ටි 03 ක් මත වකුටුකර හකුලා වළදමා තිබිණ (ඇරෑගම 2017). කෙසේ වෙතත් ලොව වෙනත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික සංදර්භයන්ගේ මිහිදන් ස්ථාන ඇසුරින් එවැනි ලක්ෂණ අනාවරණය වී තිබීමෙන් හිතාමතා උවමනාවෙන් අස්ථි සැකිල්ල සීමාවට යොදන්නට ඇති බව ද විශ්වාස කළ හැකි ය. සැකිල්ල කුඩාවන සේ හකුලා වළදමා තිබුණි. කළල ස්වරූපී යැයි හැඳින්වීම සුදුසුය (Stock et al., 2022).

කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයා පිළිබඳ පර්යේෂණ ප්‍රතිඵල

ප්ලයිස්ටෝසීන අග සමයේ පවතින වනාන්තර සම්පත් මත යැපෙමින් ජීවත් වූ කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයන් පිළිබඳ සොයාගත හැකි සෘජු සාක්ෂි කෙබඳුදැයි සොයා බැලීම ප්‍රාග් ඉතිහාසයට ඉතාම වැදගත් ය. කුරගල පුරාවිද්‍යා රක්ෂිතය තෙත් කලාපයේ වැසි වනාන්තර, අතරමැදි කලාපයේ වැසි වනාන්තර, විවෘත වියළි කලාපයේ අර්ධ සදහරිත වනාන්තර හා දිවයිනේ තෘණ සහිත තැනිතලා කලාපය අතර වූ දේශ සීමාවේ සෘජුවම පිහිටයි. 2013 කැණීම් සිදුකරන ලද කුරගල හා මීට පෙරදී කැණීම් සිදුකරන ලද අනෙකුත් ස්ථාන 03 ක් සම්බන්ධයෙන් පැට්‍රික් රොබට්ගේ ප්‍රධානත්වයෙන් කතෘ ද ඇතුළත් පර්යේෂණ කණ්ඩායමක් "ප්ලයිස්ටෝසීන අග සමයේ දී ශ්‍රී ලංකාවේ වැසි වනාන්තරවල පවතින සම්පත් මත ජීවත් වූ මානවයන් පිළිබඳ සෘජු සාක්ෂි" යන මැයෙන් 2015 වර්ෂයේ දී පර්යේෂණ පත්‍රිකාවක් ජාත්‍යන්තර සයන්ස් සඟරාවට ඉදිරිපත් කරන ලදි (Roberts et al., 2015: 1246-49).

එමගින් කුරගල ජීවත් වූ ප්‍රාග්ඓතිහාසික මානවයාගේ ජීවන රටාව පිළබඳව පුළුල් විමර්ෂණයක් සිදුකර ඇත. මෙම පර්යේෂණ තුළින් අතීත ශ්‍රී ලංකාවේ පුරා පරිසරය පිළබඳව හා පුරාවිද්‍යාත්මකව පවත්නා වෙනස්කම් අතර සබඳතාවය සෙවීම වැදගත් වේ. වර්තමානය වනවිට කුරගල ලෙන් පියස්ස කල්තොට කැලයෙන් පහළ දකගතහැකි වලව නිම්නයේ වියළි කලාපයේ තැනිතලා සමඟ වඩාත් විවෘත, අතරමැදි කලාපීය වැසි වනාන්තර කලාපයෙන් වටවී ඇත. ගල්ලෙන් ආශ්‍රිතව සිදුකර ඇති කැණීම් පර්යේෂණයෙන් අනාවරණය කරගන්නා ලද සත්ත්ව හා මානව එනමල් නියැදි පරීක්ෂාවක් මෙම කණ්ඩායම විසින් සිදුකර තිබේ (Roberts et al., 2015: 1246-49). හොලෝසීනයේ දී වාසස්ථාන ඇතිවීමට මුල්වුණු ප්‍රධාන හේතු සාධක සකස් වන්නට ඇත්තේ නිවර්තන වැසි වනාන්තර මුල්කරගනිමින් වූ ආහාර මත යැපෙමින් බව මේ පර්යේෂණ අනුව පැහැදිලි වී තිබේ.

මීට ඉහත දී පුරාවිද්‍යාත්මක හා පුරා පරිසර දත්ත සොයාගත හැකි වුව ද, ලොව පුරා වූ සර්මකලාපීය වර්ෂා වනාන්තරවල හොලෝසීන අවධියේ දී සම්පත් භාවිත කරමින් මිනිසුන් ජීවත් වූ බවට සෘජු තොරතුරු නොමැති බවක් පුරාවිද්‍යාඥයෝ විශ්වාස කළහ. නමුත් ප්‍රථම වරට මෙම පර්යේෂණයෙන් සර්මකලාපීය වර්ෂා වනාන්තරවල ඇති ලෙන් ඇසුරින් ලබාගත් මානව හා සත්ත්ව දත් එනමල් ස්ථායි කාබන් හා ඔක්සිජන් සමස්ථානික විශ්ලේෂණ පරීක්ෂාවෙන් අඩුම තරමින් අදින් වසර 20,000 කට පමණ පෙර සිට ප්ලයිස්ටෝසීනයේ අග භාගයේ සිට හොලෝසීනය දක්වා තෙත් කලාපයේ වැසි වනාන්තර, අතරමැදි කලාපයේ වැසි වනාන්තර, විවෘත වියළි කලාපයේ අර්ධ සදහරිත වනාන්තර හා දිවයිනේ තෘණ සහිත තැනිතලා කලාපයන් හි හොමෝ සේපියන් මානව ජනාවාස තිබූ බවට පැහැදිලි කරගෙන තිබේ.

මෙම පරීක්ෂණයේ දී සිදුවන්නේ, ආහාරවල ඇති සමස්ථානික තීරණය කිරීම සඳහා එනමල් මත රැඳුණු ශේෂයන් පරීක්ෂා කිරීම ය. වැඩි වශයෙන්ම වඳුරන්ගේ හා මිනිසුන්ගේ දත් මෙම පරීක්ෂණයේ දී වැඩි අවධානයකට ලක්කර තිබේ. අදින් වසර 20,000 සීමාවේ දී මෙම කලාපයේ මිනිසුන් සර්මකලාපීය වනාන්තර පුරාවටම ජීවිකාව ගෙනගොස් තිබේ (Roberts et al., 2015: 1246-49). පර්යන්ත ප්ලයිස්ටෝසීන වකවානුවේ දී හා හොලෝසීනයේ මුල් වකවානුවේ දී ජනාවාස සංදර්භයන්ගෙන් ලබා ගන්නා ලද මිනිස් හා සත්ත්ව අස්ථි එනමල මිනුම් සටහන් තොරතුරු මේ බව අනාවරණය කරයි (Roberts et al., 2015: 1246-49). හෝමෝ සේපියන් මානවයන් ප්ලයිස්ටෝසීන අවධියේ දී පරිසරයේ විවිධත්වයට ප්‍රිය කළ බවක් හැඟේ. පරිසරයට අනුවර්තනය වීමට ධාරිතාවය වැඩි වශයෙන් අවශ්‍ය විය. පවත්නා පරිසරය ජයගැනීමට තාක්ෂණය දියුණු මට්ටමට ඉහළ නංවාගෙන තිබේ.

කුරගල ආ සර්ම කලාපීය වර්ෂා වනාන්තර පරිසර පද්ධතිය සමග ද, කලාපීය වනාන්තර සම්පත් සමග ද, අතරමැදි කලාපීය ශාක සහ සත්ත්ව සම්පත් ද, උපරිම මට්ටමින්

හා පුළුල් පරාසයකින් යුතුව පරිභෝජනය කරමින් ජීවත් වූ බව පුරාවිද්‍යාත්මක කරුණු මගින් පැහැදිලි වෙයි. ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රාග්ඓතිහාසික ස්ථානයන්ගෙන් හමුවන හා අනාවරණය වන්නා වූ දත්තයන්ට සමාන හා වෙනස් දත්ත මගින් කුරගල ප්‍රාග්ඓතිහාසික මානව ජනාවාස භූමිය පෝෂිත වී ඇත. ප්‍රදේශයට ආවේණික පරිසරය හා අමුද්‍රව්‍ය මගින් මෙම ලෙන් හා එළිමහන් ජනාවාස පද්ධතියේ ජීවත් වූ ප්‍රාග්ඓතිහාසික මානවයින් තම ජීවන රටාව හැඩගස්වාගෙන ඇති බවක් පැහැදිලි ය. කුරගල ජීවත් වූ ප්‍රාග්ඓතිහාසික මානව ජීවන රටාවේ මූලික අවශ්‍යතාවයන් වූ ආහාර, වාසස්ථාන, හා ජලය යන අවශ්‍යතාවයන් නිසි ලෙසින් සම්පූර්ණ වී තිබූ නිසා වසර 15000 ක් වැනි කාල පරාසයක් ඔවුන් මෙම කලාපය කේන්ද්‍ර කරගනිමින් වාසභූමි සකසාගෙන තිබේ.

මූලාශ්‍ර

ඇරෑගම, එච්. එම්. එස්. කේ. සහ සිරිසේන, ඩබ්ලිව්. ඒ. කේ. එන්. (2013). *කුරගල පර්යේෂණ කැණීම*, අප්‍රකාශිත, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව'

ඇරෑගම, එච්. එම්. එස්. කේ. (2015). *පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පර්යේෂණ මැදිහත්වීම*, අප්‍රකාශිත, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ඇරෑගම, එච්. එම්. එස්. කේ. (2015). *කුරගල රක්ෂිතයඃ තාක්ෂණික ඇගයුම් වාර්තාව*, අප්‍රකාශිත, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ඇරෑගම, එච්. එම්. එස්. කේ. (2017)' *කුරගල ප්‍රාග් මානවයාගේ ජීවන රටාව පිළිබඳව අධ්‍යනය*, කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුරාවිද්‍යාව පිළිබඳව විද්‍යාපති උපාධි නිබන්ධය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ 07.

කාරියවසම්, එස්. එච්. (2003). දේශගුණය-වර්ෂාපතනය, *සබරගමු වංශ කථාව, 1 වෙළුම*, සබරගමුව පළාත් සභාව. 174-176 පි.

දැරණියගල, එස්. යූ. (1991). ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය, *පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා අංක 1*, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රකාශනයකි.

දැරණියගල, එස්. යූ. (2003). ප්‍රාග් ඓතිහාසික සබරගමුව, *සබරගමු වංශ කථාව, 1 වෙළුම*, සබරගමුව පළාත් සභාව. 193-221 පි.

නවරත්න, එස්. ඩබ්ලිව්. (2003). සබරගමුව පළාතේ භූ විද්‍යාව සහ පාෂාණ, *සබරගමු වංශ කථාව, 1 වෙළුම*, සබරගමුව පළාත් සභාව. 163-173 පි.

බිනරගම, දයානන්ද (2013). කුරගල ගල්ලෙන් තපෝවන ආරණ්‍ය සේනාසනය, *අරහත් සගමිත් පුද (දෙවන වෙළුම)*, සංගමිත්තා ශුද්ධාකාර පදනම.

බ්‍රෝහියර් ආර්. එල්' (1950)' *පුරාතන ලංකාවේ වාරිමාර්ග, 111 කොටස* , රජයේ මිණුම් දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය, කොළඹ.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. එන්., ප්‍රේමරත්න, එස්. ආර්. සහ අධිකාරී, ජී. (2016), *බලංගොඩ කුරගල ප්‍රාග් ඓතිහාසික ලෙන් කැණීමෙන් ලද සත්ව අවශේෂ හඳුනාගැනීමේ වාර්තාව*, පළමුවන කොටස, අප්‍රකාශිත, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය'

විජේරත්න, එච්. එම්. ජේ., චන්ද්‍රලතා, ආර්. ඒ., සන්දනායක එස්. ඩී. ජී. ඊ., බණ්ඩාර, ඒ. ඒ. එස්. එස්., ඇරෑගම, එච්. එම්. එස්. කේ. සහ බියන්විල, ජානකී (2006). *කුරගල පුරාවිද්‍යා රක්ෂිතය සහ අවට ප්‍රදේශයේ සිදුකළ හදිසි ගවේෂණයඃ ගවේෂණ වාර්තාව*, අප්‍රකාශිත, ගවේෂණ අංශය, ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, සීතාවක, අවිස්සාවේල්ල.

සන්දනායක, එස්. ඩී. ජී. ඊ., ඇරෑගම, එච්. එම්. එස්. කේ. සහ ප්‍රේමවර්ධන ජී. කේ. වයි. ආර්. (2015). *කුරගල හදිසි ගවේෂණය වාර්තාව*, අප්‍රකාශිත, ගවේෂණ අංශය, ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, සීතාවක, අවිස්සාවේල්ල.

Adikari, G. (1998). *Aspects of Prehistory of Sigiriya-Dambulla Region*, unpublished, Thesis submitted for the degree of Master of Philosophy (M.Phil.) Postgraduate Institute of Archaeology, University of Kelaniya, Sri Lanka.

Collings C. H. (1932), The Archeology of the Sabaragamuwa, *J.R.A.S. Ceylon, Vol (xxxii) – No 15.*

Cooray, P.G. (1967). *An Introduction to the Geology of Sri Lanka (Ceylon)*, Colombo, National Museum of Sri Lanka.

Deraniyagala, S. U. (1984). A theoretical framework for the study of Sri Lanka's Prehistory, *Ancient Ceylon No. 5*, Department of Archaeology, Sri Lanka.

Deraniyagala, S. U. (1992). *The Prehistory of Sri Lanka an Ecological Perspective, Vol I & II*, Department of Archaeology, Sri Lanka.

Eregama, H. M. S. K. & Perera, H. N. (2016), *Excavations of Kuragala Rockshelter, Excavation Report*, Unpublished, Department of Archaeology, Sri Lanka.

Kennedy, K.A.R. (1965). Human skeletal material from Ceylon, with an analysis of the island's prehistoric and contemporary populations. *Bulletin of the British Museum of Natural History (Geology)* 11: 135-213.

O'Connor, S. & J. Chappell., (2003). Colonization and coastal subsistence in Australia and New Guinea: different timing, different modes, In C. Sand (ed.), *Pacific Archaeology: Assessments and Prospects*. Proceedings of the International Conference for the 50th Anniversary of the First Lapita Excavation (July 1952), Koné-Nouméa 2002, pp. 15-32. Nouméa: Départment Archéologie, Service des Musées et du Patrimoine du Nouvelle-Calédonie.

Paranavithana, S. (1970). *Inscription of Ceylon volume 1*, Early Brahmi Inscriptions, Archeological Survey of Ceylon.

Perera, H. N. (2010). *Prehistoric Sri Lanka, Late Pleistocene rock shelters and an open air site*, Bar International Series.

Perera, H. N. (2013). *Kuragala excavations, Field report to the derector-general of archaeology*, Department of Archaeology, Sri Lanka.

Perera. H. N. (2015). *The importance of Sri Lankan Wet Zone Rock Shelters*, එකසිය විසිපස් වසරක පියසටහන් (පුරාවිද්‍යා ශාස්ත්‍රීය සංග්‍රහය), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය. 104-117pp.

Roberts, P., Perera, N., Wedage, O., Deraniyagala, S., Perera, J., Eregama, S., … Lee-Thorp, J. A. (2015). Direct evidence for human reliance on rainforest resources in late Pleistocene Sri Lanka. *Science*. https://doi.org/10.1126/science.aaa1230

Somadeva, R., Wanninayaka, A. & Devage D. (2015), *Kaltota Survey – Phase 1*, Postgraduate Institute of Archaeology, University of Kelaniya, Sri Lanka.

Stock, J.T., Pomeroy, E., Wedage, O., Eregama, S., Deraniyagala, S., Perera, N., Roberts, P., Boivin, N., Petraglia, M. (2022) Early Holocene human burials from Fa Hien-lena and Kuragala, Sri Lanka. *Ancient Lanka 1.*

ඡායාරූප - එච්. එම්. එස්. කේ. ඇරැගම.

Photographs © H.M.S.K. Eregama